සමාජය තුළ රෝපණය කෙරෙන්නා වූ අදහස්, මතිමතාන්තර සම්බන්ධයේදී මාධ්‍යය වෙත සෘජු වගකීමක් තිබේ. විශේෂයෙන්ම ලෝකයේ මේ වන විට ස්ත්‍රී හෝ පුරුෂ යන ලිංගික සමාජ භාවයන්ට එහා ගිය ලිංගික සමාජභාවයන් පවතින බව පිළි ගැනී පවතින, එම ප්‍රජා කණ්ඩායම් වල අයිතීන් සම්බන්ධයෙන් කතිකාවන් ඇතිවෙමින් පවතින සන්දර්භයක, මාධ්‍ය ද ඒ පිළිබඳව යාවත්කාලීන වීමත්, LGBTQ+ ප්‍රජාවන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී සංවේදී වීම, භාවාතිශය නොවීම සහ ආචාර ධාර්මික වීමත් අවශ්‍යතාවයකි.

එවන් පසුබිමකදී "කෙල්ලෙක් වෙන්න හදන කොල්ලෙක්" වැනි භාවාතිශය සඳහන් කිරීම් ඔස්සේ සංක්‍රාන්තික ලිංගිකයින්ව (transsexuals) හැඳින්වීමේදී මාධ්‍යයක් සිය සමාජ වගකීම කෙතරම් බැරෑරුම්ව සලකන්නේද යන්න ගැටළුවක් වේ.

"කෙල්ලෙක් වෙන්න ඉන්දියාවට ගිහින් ශල්‍යකර්මයේදී මැරුණු අකුරැස්සේ කොල්ලා" යන සිරස්තලයෙන් යුතුව ඉරිදා මව්බිම (සැප්. 11, 2022) පුවත්පතේ පළවූ ලිපිය ඊට නිදසුනකි. එසේම තවදුරටත් මෙම ලිපිය තුළ, පහත දැක්වෙන ආකාරයේ, සංක්‍රාන්තික ෆෝබියාත්මක (transphobic) කරා යොමු විය හැකි භාවාතිශය දැක්වීම් ද දක්නට ලැබිණි.

"රංග සඳරුවන්ට ජීවිතය අහිමි වූයේ ශරීරයේ අවයව වෙනස් කර ගනිමින් යුවතියක සේ බැබළෙන්නට තිබූ ආශාව නිසාවය. ඔහුගේ මේ ආශාව ඉටුකර ගැනීමට ඔහු පොළඹවා ඇත්තේ පවිටු මිතුරන් කීපදෙනෙකි."

"බුදුදහමට අනුව අපි මුහුණ දෙන සියලු යහපත හෝ අයහපත තීරණය වන්නේ පෙර ආත්මයේදී කළ කුසල් හා අකුසල් ක්‍රියා අනුවය... උපතින් අපිට හිමිවන බොහෝ ශාරීරික අඩුපාඩුවලට බලපාන්නේද ඒ සත්‍යයය. නීරෝගී මිනිසුන් ලෙස උපත ලබන්නේද ඒ දහමට අනුවය. ඉදින් රංග සඳරුවන්ට හිමිවූ ජීවිතය හා එහි පැවැත්ම තීරණය වූයේද පෙර පින් අනුවය."

ඔබ සිතන ලෙසට,

1) මෙම ලිපියත්, එහි සිරස්තලයත් භාවාතිශය නොවන්නේ ද? ඒ ඔස්සේ සංක්‍රාන්තික ෆෝබියාවක් ජනිත වීමට ඉඩ නොතිබෙන්නේ ද?

2) සංක්‍රාන්තික ලිංගික සමාජ භාවයකින් යුතු වීම, තමන්ගේ එම ලිංගික සමාජ භාවය හඳුනාගැනීම සහ ඒ සඳහා කටයුතු කිරීම සම්බන්ධයෙන් භාවාතිශය හා අපවාදාත්මක ස්වරයකින් වාර්තා කිරීම ඔස්සේ, සංක්‍රාන්තික ලිංගික සමාජ භාවයකින් යුතු කණ්ඩායම් කෙරෙහි සමාජය තුළ සංක්‍රාන්තික ෆෝබියාවක් සහ කොන් කිරීමක් ඇති නොවන්නේ ද?

සංක්‍රාන්තික ෆෝබියාව කරා යා හැකි භාවාතිශය වාර්තාකරණයෙන් වළකිමු!

මූලාශ්‍ර:
https://transjournalists.org/style-guide/
https://www.nuj.org.uk/.../B121E12D-034D-4A3D.../